# බටහිර අවශ්‍යතා පරාජය කරමු

බටහිරයන්ගේ බොරු තර්ජන හමුවේ කොටි ත්‍රස්තවාදීන් තම ත්‍රස්තවාදී ක්‍රියා අත්හැර නැත. අද කොටින්ගේ නියෝජිතයෝ පාර්ලිමේන්තුවටද ත්‍රස්තවාදය ගෙනැවිත් ඇත. තමන්ට අවාසිදායක යැයි සිතන පනත් සම්මත කරගැනීමට ඉඩ නොදීම ඔවුන්ගේ උපක්‍රමයවී ඇත. රාජ්‍ය නොවන පඬියකු මෙය බහුතරවාදයට විරුද්ධව කරන අරගලයක් යැයි කීමට බැරි නැත. මොවුන් බහුතරවාදය යනුවෙන් නම් කරන්නේ වැඩිදෙනාගේ කැමැත්තට අනුව කටයුතු කිරීමය. බහුතරවාදය බටහිර ඊනියා ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මකවීමේදී යොදා ගැනෙන විධික්‍රමයය. වෙනත් විධි ක්‍රමයක් බටහිර රටවල ක්‍රියාත්මක නොවෙයි. ඇමරිකන් එක්සත් ජනපදවල ජනාධිපති ලෙස බුෂ් මහතා මුලින් පත්වූයේ නිතරගයෙන් නොවේ. ඉතා සුළු වැඩි ඡන්ද ප්‍රමාණයකින් ඔහු පත්වූයේ ඇතැම් ඡන්ද පෙට්ටි ගණන් නොකරමින්ය. එහෙත් ඔහු ජනාධිපතිවීමෙන් පසුව ඩිමොක්‍රටික් පක්ෂයේ ඡන්ද අනුපාතය අනුව ඔවුන්ගේ අදහස්වලට කන් නොදුන්නේය. බටහිරයන්ට ජයග්‍රාහකයන් හා පරාජිතයන් මිස අතරමැදි තත්ත්වයන් නැත. සිංහලයන්ගේ ක්‍රමයෙහි, එනම් මහා සම්මතවාදයෙහි ප්‍රජාතන්ත්‍රවාදයෙහි නොමැති ලක්ෂණ අඩංගු වෙයි. එහෙත් අප දැන් ක්‍රියාත්මක කරන්නේ ප්‍රජාතන්ත්‍රවාදය මිස මහා සම්මතවාදය නොවයි.

ඒ කෙසේ වෙතත් බටහිරයන් ප්‍රජාතන්ත්‍රවාදය යටතේ එක් ඡන්දයක් පමණක් වැඩිපුර ලබාගත් තැනැත්තාගේ හෝ පක්ෂයේ හෝ මතය ක්‍රියාත්මක කරද්දී නිහඬවන රාජ්‍ය නොවන පඬියෝ ඒ ප්‍රතිපත්තිය ලංකාවේ ක්‍රියාත්මක වන විට බහුතරවාදය පිළිබඳ පඬිවදන් කියති. ඔවුන්ට අවශ්‍ය ලංකාවේදී සුළුතරයේ ඒකාධිපතිවාදය ක්‍රියාත්මක කිරීමය. දහනවවැනි ශතවර්ෂයේ අග භාගයෙහි සිටම මෙරට දෙමළ නායකයන්ට අවශ්‍ය වූයේ සුළුතරයේ ඒකාධිපතිවාදය ක්‍රියාත්මක කිරීමටය. බ්‍රිතානි ආණ්ඩුකාරයන් මෙරට සිටි සමයෙහි ඔවුන්ගේ ආධාරයෙන් දෙමළ නායකයෝ සුළුතර ඒකාධිපතිවාදය ක්‍රියාත්මක කළහ. බ්‍රිතානි ආණ්ඩුකාරයන් ශාරීරික වශයෙන් පිටවී ගිය පසුද, දෙළ ජාතිවාදීන් සෝල්බරි ව්‍යවස්ථාවේ විසිනවවැනි වගන්තිය ආධාර කරගනිමින් යම් කාලයක් සුළුතර ඒකාධිපතිවාදයක් ක්‍රියාත්මක කෙළේ එංගලන්තයේ අභියාචන උසාවියක් ලෙස ක්‍රියාත්මක වූ ප්‍රිවි කවුන්සලයද යොදා ගනිමිනි. 1962 රාජ්‍ය විරෝධී කුමන්ත්‍රණයට හසුවී මෙරට ශ්‍රේෂ්ඨාධිකරණයෙන් දඬුවම් පමුණුවණු ලැබුවෝ ප්‍රිවි කවුන්සලයෙන් යම් වචන හරඹයක් යොදා ගනිමින් නිදහස් කරනු ලැබූහ. සිංහල භාෂා පනතට විරුද්ධව ප්‍රිවි කවුන්සලයෙහි නඩු කී එක් දෙමළ ජාතිවාදියකු ඉන් ජයග්‍රහණය කෙළේ බ්‍රිතානි යටත් විජිතවාදයෙහිද සහාය ලබමින්ය.

එංගලන්තයේ ප්‍රිවිකවුන්සිලයට අභියාචනා ඉදිරිපත් කිරීමට තිබූ අවස්ථාව නැති කිරීමත්, 1972 ජනරජ ව්‍යවස්ථාවෙන් විසිනවවැනි වගන්තිය ඉවත් කිරීමත් සමඟ දෙමළ ජාතිවාදී නායකයන්ගේ ජාතිවාදී අභිලාෂ සෝල්බරි ව්‍යවස්ථාව ඔස්සේ මුදුන්පත්කර ගැනීමට තිබූ ඉඩ ඇහිරිණි. සිංහලයන් අතර සිටින රාජ්‍ය නොවන හා වෙනත් බොරු පණ්ඩිතයන් (සුද්දන් ඉංගිරිසියෙන් කියන දේ තමන්ට තේරෙන පමණට ග්‍රහණය කර ඒ ඉංගිරිසි නොකියවන සිංහලයන්ට සිංහලෙන් කියාදී පොරවල්වීම හැරෙන්නට ඔවුන් කරන වෙනත් කාරියක් නැත) සුද්දන්ගේ විසිනව වැනි වගන්තිය ඉවත් කිරීමට විරුද්ධ වන්නේ නම් ඉන් කියැවෙන්නේ ඊනියා සමාජවාදයක් ගැන නන් දොඩෙව්වද, යටත් විජිත විරෝධී වෙසක් මවා ගත්තද බොරු ප්‍රබුද්ධයන්ගේ යටත් විජිතගැති බව මිස අනෙකක් නොවෙයි. සිංහලය රාජ්‍ය භාෂාව කිරීමටත් කලකට පෙර 1947 දීම වෙනම දෙමළ රාජ්‍යයක් බිහි කිරීමේ අරමුනින් ඊනියා ෆෙඩරල් පක්ෂය හෙවත් දෙමළ රාජ්‍ය පක්ෂය පිහිටුවාගෙන සිටි දෙමළ ජාතිවාදීහු තම අභිලාෂය මුදුන්පත් කරගැනීම සඳහා අවි අතට ගත්හ. ඒ සඳහා බහිරයන්ගේ සහාය දෙමළ ජාතිවාදීන්ට ලැබිණි. දෙමළ ජාතිවාදීන්ට බටහිර රටවල තම ප්‍රචාරක කටයුතු පහසුවෙන් කරගෙන යාහැකි වූයේ ඒ ප්‍රචාරයට බටහිරයන්ගේ අනුග්‍රහය ලැබුණු බැවින්ය. බටහිර ජනමාධ්‍ය ප්‍රචාරය කරන්නේ ඔවුන්ට අවශ්‍ය දේ මිස ඊනියා තුන්වැනි ලෝකයේ අසාධාරණයකට ලක්වී යැයි කියන ජනවර්ගයකගේ මතයක් නොවෙයි. බටහිර ජනමාධ්‍ය සර්ව සාධාරණව පීඩාවන්ට ලක්වූවන් වෙනුවෙන් පෙනී සිටින්නේ යැයි කිවහැක්කේ ඔවුන් වෙනුවෙන් කඩේ යන්නන්ට හා සමාජවාදී යටත් විජිතවාදී ගැත්තන්ට පමණකි. (යටත් විජිතවාදීන්ගෙන් යැපෙන ඊනියා සමාජවාදී රාජ්‍ය නොවන පඬියන් හැඳින්වීමට සමාජවාදී යටත් වජිතවාදීන් යන්න සුදුසු යැයි සිතමි.)

බටහිර යටත් විජිතවාදීන් දෙමළ ජාතිවාදය ඇති කළේ මෙරට ලන්දේසි යුගයෙහිදීය. බ්‍රිතානියෝ දෙමළ ජාතිවාදය බෞතීස්ම කළහ. ඉන්පසු එය ඇති දැඩි කළහ. එයට අවශ්‍ය සියලු පහසුකම් සැපයූහ. අද දෙමළ ජාතිවාදයට

© Prof. Nalin De Silva

පහසුකම් සපයන බටහිර රාජ්‍යය බවට පත්වී ඇත්තේ නෝර්වේ රාජ්‍යය. මේ සියලු පහසුකම් මැද ද, සිංහලයන් අතර සිටිමින් සිංහලයන්ට විරුද්ධව ක්‍රියා කරන සතිඅන්ත පත්තර කඩමාළුවලට කුලියට ලියා ජීවිතය ගැටගසා ගන්නවුන්, රාජ්‍ය නොවන පඬියන් ආදී එකී නොකී බටහිර ගැත්තන් හා සමාජවාදී යටත් විජිතවාදීන් ආදීන්ගේ පාවාදීම් මැද ද දෙමළ ජාතිවාදීන්ට තම සිංහල විරෝධී අභිලාෂ මුදුන්පත් කර ගැනීමට නොහැකිවී ඇත. අවි අතට ගෙන අවුරුදු තිහකට පමණ පසුවද ප්‍රභාකරන්ට තම දෙමළ ජාතිවාදී අවශ්‍යතා කිසිවක් දිනා ගැනීමට නොහැකිවී ඇත. ඔහු අද වයසට යමින් සිටියි. ඔහුට තම දෙමළ ජාතිවාදී සිහින සැබෑකර ගැනීමට එතරම් කාලයක් ස්වභාවය නොදෙනු ඇත. අද ඔහු ක්‍රියා කරන්නේ වියරුවෙන්ය. කොටි ත්‍රස්තවාදයේ පාර්ලිමේන්තු නියෝජිතයන් අද පාර්ලිමේන්තුවේදී ක්‍රියා කරන්නේ මේ වියරුවෙන් දෙන නියෝග පිළිපදිමින්ය.

බටහිරයන් දෙමළ ජාතිවාදයට අනුග්‍රහ දැක්වුවද, ආධාර කළ ද, අද ප්‍රභාකරන්ගේ වියරු ක්‍රියා හමුවේ ඔවුන්ටද ඇතැම් පියවර ගැනීමට සිදුවී ඇත. පසුගියදා කොටි ත්‍රස්තවාදීහු ඊනියා සටන් නිරීක්ෂණ කමිටුවේ කාර්යාලයකටද බෝම්බ ගැසූහ. වෙන තැනක එවැන්නක් සිදුවූ විට කවුරුන් කෙළේ දැයි දැන ගැනීමට අංජනන් එළියක් බැලීමට කතා කරන සටන් නිරීක්ෂකයෝ මෙදා එක්වරම ඒ කොටි ත්‍රස්තවාදීන්ගේ ක්‍රියාවක් බව දැනගත්හ. ඒ ඊනියා සටන් නිරීක්ෂකයන්ට එදා පමණක් බුද්ධිය පහළවීම නිසා නොව ජීවිත භය ඇතිවීම නිසා සිදුවූවක් විය. සිංහලයන් අතර සිටින දෙමළ ජාතිවාදී බැලයන්ටද යම් දිනක කොටි ත්‍රස්තවාදීන්ගෙන් තර්ජනයක් ඇති වුවහොත් ඔවුන් ක්‍රියා කරන ආකාරයද අපට දැකගත හැකිවනු ඇත. කෙසේ හෝ වේවා අද බටහිරයන්ට තරමක ප්‍රශ්නයක් ඇතිවී තිබේ. ඔවුන්ට දෙමළ ජාතිවාදය පවත්වාගෙන යෑම අවශ්‍ය වෙයි. එහෙත් ඒ අතර ප්‍රභාකරන්ගේ වියරුව පිළිබඳවද තීරණයක් ගැනීමට සිදුවී තිබේ. අද ප්‍රභාකරන්ගේ වියරුව පාර්ලිමේන්තුවේ දැකගත හැකිවී ඇත්තේ එ.ජා.ප. කතානායකවරයකු එහි සිටින අතරය. ඔහු ඒ තනතුරට පත්කර ගැනීමේදී සහාය දක්වූවනටද අද ඔහු ගැන කතා කිරීමට සිදුවී ඇත්තේ මනාපයකින් නොවෙයි. පාර්ලිමේන්තුවේ කොටි වියරුව දෙමළ ජාතිවාදයේ පත්තර කඩමාළු හා රාජ්‍ය නොවන උගතුන් විවිධාකාරයෙන් විග්‍රහ කරනු ඇත. සමහරුන්ට එය ඊනියා අසමත් රාජ්‍යයක් තවත් ප්‍රදර්ශනයක් පමණක් වනු ඇත. එහෙත් බටහිර බලවතුන්ගේ හා එ.ජා. පක්ෂයේද සහාය (ඊනියා සටන් විරාම ගිවිසුම නමින් හැඳින්වෙන රනිල් ප්‍රභාකරන් ගිවිසුම මේ සහායට උදාහරණයක් පමණකි) ලැබීමෙන් පසුවත් අසමත්වී සිටින ප්‍රභාකරන් ගැන ඔවුන් කතා නොකරනු ඇත.

මෙරට අද ඇත්තේ බටහිරයන්ගේ අසමත්වීම පිළිබඳ ප්‍රශ්නයකි. දෙමළ ජාතිවාදය, රාජ්‍ය නොවන සංවිධාන, සඟරා, පත්තර, විද්‍යුත් නාලිකා, බොරු පණ්ඩිතයන් පමණක් නොව ඊනියා දාර්ශනික ලේඛකයන් ඔස්සේ ඉදිරිපත් කෙරුනු මහායානයද යොදා ගැනීමෙන් පසුවත් සිංහල ථෙරවාද බුදුසසුන හා අදාළ සංස්කෘතිය නැති කිරීමට බටහිරයන් ගත් උත්සාහ ව්‍යර්ථවී ඇත. අසමත්වී ඇත්තේ බටහිරයන් හා ඔවුන්ගේ නිවට සේවකයන්ය. එහෙත් අද බටහිරයෝ ඔවුන්ට ඇති දැනුම් ආධිපත්‍යය යොදා ගනිමින් ඊනියා අසමත් රාජ්‍යයක් ගැන මත එතැනින් මෙතැනින් ප්‍රකාශ කරති. අසමත් වුවද බටහිරයන් තම ව්‍යායාමය අත්හැර නැත. ඇමරිකන් රාජ්‍ය දෙපාර්තමේන්තුවේ ප්‍රධානීහු ලංකාවට එති යති. සොල්හයිම් එළවීමට ඔවුහු ඉඩ නොදෙති. සොල්හයිම්ද මේ දිනවල ලංකාවට පැමිණීමට නියමිතය. මේ සියලු ගමන් බිමන් ඊනියා සාම සාකච්ඡා ඔස්ලෝහිදී පැවැත්වීම සඳහාය. එහෙත් ආණ්ඩුව එයට හිස නොනමා සිටියහොත් බටහිරයන්ට ප්‍රභාකරන් ඉවත් කිරීම ගැන කල්පනා කිරීමට සිදුවනු ඇත. අද තත්ත්වය එතැනට මෝරා ඇත. එහිදී ප්‍රභාකරන් ඉවත් කරන්නේ කෙසේද යන්න බටහිරයන්ට තීරණය කිරීමටද ඉඩ නොදිය යුතුය. ඔවුන් ඒ සඳහා එක්සත් ජාතීන්ගේ හමුදා ගෙන්වීමට කටයුතු කරනු ඇත. ආණ්ඩුව අද කළ යුත්තේ මේ සියලු උපක්‍රම පරාජය කිරීමට සැලසුම් කිරීමය. පළමුවෙන්ම ඔස්ලෝ ගමන කෙසේ හෝ නැවැත්විය යුතුය. දෙවනුව ප්‍රභාකරන් ඉවත් කිරීමේ කාර්යය තමන් අතට ගත යුතුය. එහිදී හමුදාව ශක්තිමත් කිරීමත් එයටත් වඩා හමුදාවේ මානසිකත්වය වර්ධනය කිරීමත් අනිවාර්ය වෙයි. රාජ්‍ය නොවන පණ්ඩිතයන්මෙන්ම තවමත් තමන් ජනාධිපතිනිය සේ සිතා කටයුතු කරන චන්ද්‍රිකා කුමාරතුංග මහත්මියගේ හිතවතුන්ද රටට වින කරන බොරු මාක්ස්වාදීන්ද තීරණ ගන්නා තැන්වලින් මෙන්ම ප්‍රායෝගික ක්‍රියාවලින්ගෙන්ද ඉවත් කළ යුතුය. එසේ නොකරන්නේ නම් අප පරාධීන ජාතියක් වනු ඇත. මේ රටේ ස්වෛරීභාවය රැඳී ඇත්තේ එක් වචනයක් මතය. ඒ අනෙකක් නොව ඒකීය හෙවත් එක්සේසත් යන්නය. පණ්ඩිතයන්ට නයාට අඳුකොළ මෙන් වී ඇත්තේද ඒ වචනයය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva